විශ්වජිත් සන්දේශ් සූරියබණ්ඩාර

සන්නස වෙනුවෙන්ම ලියන ආදරණීය ම නවකතාව

ඔහු මේ කාමරයේ සිටි බවට දැකගන්නට තිබුණ එකම සළකුණ මේසය මත තිබූ මල් පොකුර පමණක් විය. එය ද පරව යමින් තිබුණි. ඔහු ළඟ තිබූ මිහිරි සුවඳ විළවුන් සුවඳ කාමරය තුළින් ඇයට දැනුණි. ඇගේ සිතට කණගාටුවක් දැනුණි.



# සිහිනයක් වගේ.... 6

## ස්නේහාගේත් අකලංකගේත් කතාව



රෝහල ඉදිරියේ එකම ගාලගෝට්ටියකි. කැමරා ආම්පන්න එල්ලාගත් මිනිසුන් ය. මයික්‍රෆෝන අතින් ගත් කෙල්ලන් ය. හැමෙ-ර්ම කොකුන් සේ රෝහල ඇතුළට දික්කරගත් බෙලි ඇතිව බලා සිටින්නේ දැන් දැන් කිසිවකු රෝහලේ දොරෙන් එලියට පනිනු ඇතැයි යන බලාපොරොත්තුවෙන් වගේ ය. මේ පිරිස අතරින් වාහනය ඉදිරියට ගත නොහැකිව චන්ද්‍රසේන පාර මැද වාහනය නවතාගෙන බලා සිටියේ ය.

"මොකද චන්ද්‍රසේන අංකල් මේ? අද මෙහෙ උත්සවයක්ද?" ස්නේහා අසන්නේ පුදුමයෙනි.

"දෙයියො තමයි දන්නෙ මිසී... ඇමතියෙ-ක්වත් එනවද දන්නෑ"

"එහෙම වෙන්නැති.. මේ සෙනග අස්සෙන් ඔයාට වාහනේ ගන්න වෙන්නෙ නෑ වරු-වකට.. මං මෙතනිං බැහැගන්නං අංකල්.. " ස්නේහා කීවේ දොර අරින අතර ය.

චන්ද්‍රසේන අනුමැතිය දෙන්නටත් පෙර ම ස්නේහා දොර ඇරෙගන වාහනයෙන් බැස්සා ය.

රෝහලේ මහ දොරටුව අවහිර කරගෙන සිටින පිරිස අතරින් අපහසුවෙන් රිංගා ගත් ඇය පඩි දෙකක් නැග්ගා පමණකි කිසිවකු ඇගේ අතින් අල්ලාගත්තේ ය.

"මිස් ඔයා නේද ස්නේහා කියන්නෙ?" ප්‍රශ්නය ඇසුවේ අතින් අල්ලා ඇය නවතාගත් වාර්තාකාරයා ය. ඇය උත්තරයක් දෙන්නටත් පෙරම මස්වැදැල්ලකට පොරකන කපුටන් රැළක් සේ වාර්තාකාර නඩය ඇය වට කර ගත්හ.

ඔවුන් එකවර ඇසූ ප්‍රශ්න කිසිවක් ඇයට නොවැටහුණ නමුත් වැඩියෙන්ම කියවුණ නම නම් ඇයට හොඳින් ඇසුනි.

අකලංක... අකලංක.. අකලංක හැම ප්‍රශ්නයක් අතරින්ම ඇසුණේ ඒ නම ය. "අකලංක ඉන්නෙ මොන කාමරේ ද?" මහා ගාලගෝට්ටිය ටිකකට තුරල් වෙද්දී යම් කිසිවකු ඇසූ ඒ ප්‍රශ්නය ඇයට හොඳින් ඇසුණි.

"අනේ මං දන්නෑ" ඇය එසේ කීවද එය කිසිවකුට ඇසුණ බවක් නොපෙනුණි. ප්‍රශ්න අසන්නට පොරකෑවා මිස ඇගේ උත්තරය අසන්නට ඔවුන්ට කල්පනාවක් නොතිබුණා සේ ය.

"කවදද ඇඩ්මිට් කළේ?"

"බොරු ලෙඩ නේද?"

"අමාරුද?"

"තුවාලද?"

"ඔපරේෂන් එකක් කළා කියන්නෙ ඇත්තද?"

"සිහිය තියෙනවද?"

"කිසි දෙයක් මතක නෑ කියන්නෙ ඇත්තද?"

රෝහලේ ආරක්ෂක නිලධාරීන් කීප දෙනෙකු පැමිණ ඇය ගලවා ගන්නාතෙක් ඒ ගෝසාව නොනැවතුණි. වෘකයන් රැළකගෙන් ගැළවී ගත් හා පැටවකු සේ ස්නේහා රෝහළ තුළට දුව ගියා ය. වෙනදා පළමුව කරන පොත අස්සන් කිරීම වෙනුවට ඇය අඩියෙන් දෙකෙන් පඩිපෙළ නැග ගොස් නැවතුනේ අකලංකගේ කාමරය ඉදිරියේ ය. සැනෙකින් කාමරයේ දොර ඇරිය ස්නේහා එතුළට ගියා ය. කාමරය හිස් ය. අකලංක පිටව ගොස් ය. ඔහු මේ කාමරයේ සිටි බවට දැකගන්නට තිබුණ එකම සළකුණ මේසය මත තිබූ මල් පොකුර පමණක් විය. එය ද පරව යමින් තිබුණි. ඔහු ළඟ තිබූ මිහිරි සුවඳ විළවුන් සුවඳ කාමරය තුළින් ඇයට දැනුණි. ඇගේ සිතට කණගාටුවක් දැනුණි. එසේ කණගාටුවන්නට කාරනාවක්ද නැත. ඔහු වැනි ලෙඩුන් සිය ගණනකට ඇය සාත්තු කර ඇත . ඔහු තවත් එවැනිම වූ ලෙඩෙක් නොවේද? ඒ ප්‍රශ්නයට ඇයට නිවැරදි උත්තරයක් සිතා ගත නොහැකි විය. ඔහු සාමාන්‍ය ලෙඩෙක් වී ද? එසේ නොවන බව ඇගේ සිත කියයි.

ස්නේහා කාමරයට ඇතුල් වූවා ය. මේසය මත වූ මල්බඳුන යට කුඩා කඩදාසි කැබැල්ලක් තිබෙනු ඇය දුටුවා ය. ඈ මල් බඳුන මදක් ඈත් කර සීරුවෙන් එය අතට ගත්තා ය.

"ස්නේහා.. මං යනවා.. අකලංක" හදිසියෙන් කුරුටුගාන්නට ඇතැයි සිතිය හැකි ඒ අකුරු පෙළ ස්නේහාගේ සිත සසළ කළේ ය. ඈ නැවතත් ඒ වදන් පේලිය කියෙව්වා ය. තමාට යන බව කියා යාමට ඔහුට ඇති අවශ්‍යතාව කුමක්ද? එතරම් ලොකු ලෙන්ගතු කමක් තමන් අතර වීද? ස්නේහා සුසුමක් හෙලුවා ය. ඉන්පසු කඩදාසි කැබැල්ල දෙකට නවා අත්බෑගයට දමා ගත්තා ය.

**මතු සම්බන්ධයි**